**සිංහල භාෂාව හා සාහිත්‍ය තරග 2024 (කලාප)**

අපේක්ෂකයාගේ නම :- ..........................................................................

(මුලකුරු සමග නම)

පාසලේ නම :- ..........................................................................

පාසල් වර්ගය :- 200 ට අඩු / 201 - 500 / 501 ට වැඩි

කොට්ඨාසය :- ..........................................................................

කලාපය :- ..........................................................................

කාලය පැය 03

මුළු ලකුණු 100

## ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

12 /13 ශ්‍රේණිය

I කොටසින් එකක් ද II කොටසේ (අ) යටතේ එකක් ද (ආ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

## I කොටස

1). පහත දැක්වෙන විස්තර කියවා එකක් තෝරා ගෙන අදාල මාතෘකාව යොදා ගෙන වචන 500 කට නොඅඩු රචනයක් ලියන්න.

(අ) සංචාරක ව්‍යාපාරය අද්‍යතන සමයේ තෙවැනි ලෝකයේ රටවලට මහත් ආශිර්වාදයක් වී ඇත. ශ්‍රී ලංකාවට ද මේ ව්‍යාපාරය ඔස්සේ ලැබෙන විදේශ විනිමය සැලකිය යුතු තරම් ප්‍රමාණයකි. එනමුත් සංචාරක ව්‍යාපාරය මගින් විවිධ ගැටළුකාරී ස්වරූපයන් ද උද්ගත කරවයි. එබැවින් මේ ක්‍රියාවලිය බුද්ධිමත් ලෙස කළමනාකරණය කර ගත යුත්තකි.

(ආ) මිනිසාට දැනුමෙන් පරිපූර්ණ වීමට විවිධ සාහිත්‍ය පොත පත උපකාරී වෙයි. එහෙත් තාක්ෂණික ලෝකයේ අතරමංව සිටින නූතන පරපුර සාහිත්‍ය පොතපත පරිශීලනයෙන් ඈත් වෙමින් සිටිති. දිනෙන් දින බොහෝ පොත්පත් පළවූවත් ඒවා කියවන පිරිස ඉතා සීමිතය. මේ තත්ත්වය රටේ අනාගතය කෙරෙහි ඉතා අයහපත් ලෙස බලපායි. හිස් වූ මොළ ඇති මිනිසුන්ගෙන් පිරි රටක අනාගතය කුමක් විය හැකි ද? ගුණ ධර්ම පිරුණු සමාජයක් බලාපොරොත්තු වීම උගහට ය.

(ඉ) මත්ද්‍රව්‍ය භාවිතය නිසා තම ජීවිතය පමණක් නොව අන්‍යන්ගේ ජීවිත ද දුකට පත් කරයි. ඉතා කෙටි කලකින් සිදු වන ජීවිත විනාශය සමග මුළු මහත් සමාජය ම විනාශය කරා යොමු කරයි. මේවා භාවිතයේ දී ඇති ආදීනව කියා දීම හෝ සඬුවම් දීමට වඩා මේවා ගෙන්වන බෙදා හරින ක්‍රමවලට වැට බැඳීම සිදු කළ යුතු ය. මෙම සමාජ ව්‍යසනය පිළිබඳව පුළුල්ව සිතා බැලිය යුතු ය.

(ඊ) සියදිවි හානි කර ගැනීම අතින් අප රට ලොව ප්‍රමුඛ තැනක් ගෙන ඇත. අතීතයේ මෙවැන්නක් නොවීය. ආර්ථික ගැටළු, මානසික ගැටළු, ප්‍රේම සම්බන්ධතා හා වෙනත් ප්‍රශ්න මීට බලපාන බව නොරහසකි. මේ තත්වය අවම කර ගැනීමට කළ යුත්තේ මොනවා ද?

(ලකුණු 50)

## II කොටස (අ)

(අ) i. ජයවඩන ගම්මානයේ දැනට පවුල් 70 ක් පමණ ජීවත් වේ. ඔවුන්ට බීමට අවශය ජලය සොයා ගැනීම දුෂ්කර ගැටළුවක් වී ඇත. නළ ළිං ව්‍යාපෘතියක් හෝ නළ මඟින් ජලය ලබා දීමක් හෝ සකස් කරන්නේ නම් ඔවුන්ට කරන මහත් සේවයකි. වැසිකිළි පද්ධතියක් ද සැලසුම් කිරීමට අවශ්‍යව ඇත. මේ කරුණු පිළිබඳව ප්‍රාදේශීය ලේකම් තුමාට යවන ලිපිය ලියන්න.

(ලකුණු 25)

නැතහොත්

ii. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් සඳහා අප රටේ ස්වාභාවික සුන්දරත්වය අළලා කෙටි වාර්තා චිත්‍රපටියක් සෑදීමට "ලලිතසර" ආයතනය සැරසෙයි. ඉකිරිගොල්ල, කුමුදුගම පදිංචි සුවඳසිංහ ඔබ යැයි සිතා ඔබ ගමේ ඇති වැදගත්කම, සුන්දරත්වය සඳහන් කරමින් එම චිත්‍රපටියට ගැළපෙන තැන් එහි ඇති බව කියා අංක 23, උයන පෙදෙසේ ලලිතසර අධ්‍යක්ෂතුමාට ලියන ලිපිය ලියන්න.

(ලකුණු 25)

## (ආ) කොටස

පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පුවත්පත පල කිරීම සඳහා යෝග්‍ය වාර්තාවක් සකස් කරන (මේ සඳහා වචන 100 ක් පමණ ප්‍රමාණවත් ය.)

බලපිටිය සිද්ධාර්ථ මහා විද්‍යාලය විසින් සංවිධානය කරන ලද වාර්ෂික නිවාසාන්තර උත්සවයට සහභාගී වූ පුවත්පත් වාර්තාකරුවකුගේ සටහනක් පහත දැක්වේ.

| | |
|---|---|
| දිනය | : 2024. 04. 28 |
| වේලාව | : ප.ව. 2.00 |
| ස්ථානය | : නාවලපිටිය, ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය |
| ප්‍රධාන ආරාධිතයා | : අධ්‍යාපන අමාත්‍යාංශයේ, ක්‍රීඩා අධ්‍යක්ෂ |

මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා යන නිවාස අතුරින් උපේක්ෂා නිවාසය ශූරතාවය දිනා ගත්තේය. සරඹ සංදර්ශනය හා තූර්යවාදන සන්දර්ශනය අවසානයේ දී පැවැත්විණ. (පුවත්පත් වාර්තාකරු ඔබ යැයි සිතන්න.)

(ලකුණු 25)

නැතහොත්

සුන්දරගම යෞවන සමාජය මඟින් වසරක් පාසා පැවැත්වීමට අපේක්ෂිත අවුරුදු උත්සවයේ ක්‍රියාකාරී බල මණ්ඩලයේ ලේකම් ඔබ යයි සිතා එම උත්සවය ගැන දැනුවත් කිරීමට සුදුසු දැන්වීමක් සකස් කරන්න.

(ලකුණු 25)